10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 16 පාඩම

සැකසුම හා ඉදිරිපත් කිරීම


ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.


අධීක්ෂණය


බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 16 පාඩම

# බුදු සිරිතයි - පරිසරයයි

# පරිසරය යනු...

✓ පරිසරය යනු අප අවට ඇති වටපිටාව යි



# පරිසරයේ ප්‍රධාන ආකාර දෙකකි.


- ජීව පරිසරය
- අජීව පරිසරය

# සිදුහත් බෝසතාණන් පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා




සිදුහත් බෝසතාණන් ගේ උප්පත්තිය සොඳුරු පරිසර පද්ධතියක් වූ ලුම්බිණි නම් සල් උයනෙහි සිදු වීම.

# සිදුහත් බෝසතාණන් පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා




බෝසතාණන්ගේ ළමා කාලය ස්වභාවික පරිසරය ආශ්‍රය කරගෙන ගත වීම

# සිදුහත් බෝසතාණන් පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා



වප් මඟුල් දින
දඹ රුක්
සෙවනේ සිසිලස
ලබමින් බවුන්
වැඩීම

# සිදුහත් බෝසතාණන් පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා




ගිහිගෙය හැර ගොස් කිං කුසල ගවේසීව කටයුතු කළ වකවානුවේ මිනිස් වාසයෙන් තොර නිසංසල පරිසර පද්ධති වල දිවි ගෙවීම

# බුදුන් වහන්සේ පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා



බුද්ධත්වය සඳහා තෝරා ගත් නේරංජනා නදීතීරය සිත්කලු රමණීය භූමි ප්‍රදේශයක් වීම

# බුදුන් වහන්සේ පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා




උතුම් බුදු බව ලබාගැනීමට උපකාරී වූ ඇසතුබෝධි වෘක්ෂයට දින හතක් ඇසිපිය නොහෙළා ඒ දෙස බලා සිටිමින් කෘතවේදීත්වය දැක්වීම

# බුදුන් වහන්සේ පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා

- බරණැස සිට උරුවේලාවට වඩින මාර්ගයෙහි පිහිටි කැප්පෙට්ටියා ලැහැබක විවේක සුවයෙන් පසු වන විට භද්දවග්ගිය කුමාරවරුන්ට හමු වීම

# බුදුන් වහන්සේ පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා



බිම්බිසාර රජු බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණියේ රජගහ නුවරට සමීප තල් වනයක වැඩ සිටි අවස්ථාවක වීම

# බුදුන් වහන්සේ පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා



ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද, බුදුන් වහන්සේ අනෝමා නදී තීරයෙහි අනුපිය අඹ වනයෙහි විවේක සුවයෙන් ගත කරන විට සිදු වීම

# බුදුන් වහන්සේ පරිසරය කෙරෙහි හිතානුකම්පීව කටයුතු කළ අවස්ථා



බුදුන් වහන්සේ රජගහ නුවර සීත වනයෙහි වැඩ සිටිය දී අනේපිඬු සිටුතුමා මුල්වරට මුණ ගැසීම

# බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිත ව වස් විසූ ස්ථාන


- පළමු වස් කාලය - බරණැස ඉසිපතන මිගදාය
- දෙවන, තෙවන, සිව්වන වස් කාලයන් - ලෙහෙනුන්ගේ අභය භූමියක පිහිටි වේළුවනාරාමයෙහි
- පස්වන වස් කාලය - විශාලා මහනුවර කූඨාගාර ශාලාව
- හයවන වස් කාලය - මකුල පර්වතයෙහි
- අටවන වස් කාලය - භේෂකලා පර්වතයෙහි
- දහවන වස් කාලය - පාරිලෙයා්‍ය වනයෙහි වැඩ වසමින් ඇතෙකුගේ හා වඳුරෙකුගේ උවටැන් ලැබීම
- දහතුන, දහඅට, දහනවය, වස් කාලයන් - චාලිය පර්වතයෙහි වැඩ විසීම

# බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිත ව වස් විසූ ස්ථාන



දහවන වස් කාලය - පාරිලෙයාය වනයෙහි වැඩ වසමින් ඇතෙකුගේ හා වඳුරෙකුගේ උවටැන් ලැබීම

# බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිත ව වස් විසූ ස්ථාන



පස්වන වස් කාලය - විශාලා මහනුවර කූඨාගාර ශාලාව

# බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත් කර ගත් අවස්ථා



ඉසිපතන මිගදායේ පළමු දහම් දෙසුම පැවැත්වීම

# බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත් කර ගත් අවස්ථා

- ගිජ්ජකූට පර්වතයේ සූකරකත ලෙනෙහි වැඩවසන විට වේදනා පරිග්‍රහ සූත්‍රය දේශනා කිරීම
- ඉච්ඡානංගල වනයෙහි වැඩ සිටිය දී අම්බට්ඨ සූත්‍රය දේශනා කිරීම
- අචිරවතී නදී තීරයෙහි පිහිටි අඹ වනයෙහි දී තේවිජ්ජ සූත්‍රය දේශනා කිරීම
- විශාලා මහනුවර වන පියසක දී මහා සීහනාද සූත්‍රය දේශනා කිරීම

# බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත් කර ගත් අවස්ථා

- ලෙහෙණුන්ගේ අභය භූමියක් වූ කලන්දක නිවාප නම් ස්ථානයේ දී මහා මොග්ගල්ලාන සූත්‍රය දේශනා කිරීම
- ඇට්ටේරියා වනයක දී සිංසපා සූත්‍රය දේශනා කිරීම
- චම්පා නුවර අසර ගග්ගරා පොකුණ සමීපයේ දී සෝණදණ්ඩ සූත්‍රය දේශනා කිරීම
- ජීවක අඹ උයනේ දී සාඤ්ඤඵල සූත්‍රය දේශනා කිරීම
- මහී ගංගා තීරය අසල සොඳුරු සවස් භාගයේ දී ධනිය ගෝපාල සූත්‍රය දේශනා කිරීම

# බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත් කර ගත් අවස්ථා



කෙත් යායක දී කසී භාරද්වාජ සූත්‍රය දේශනා කිරීම

# බුදුන් වහන්සේ පරිසරයේ සොඳුරු බව ඇගයිමට ලක් කළ අවස්ථා

➢ බුදුන් වහන්සේ නිතර ඇසුරු කළ රජගහනුවර හා ඒ අවට ස්ථාන කිහිපයක් වර්ණනා කළ අවස්ථාව

“ආනන්දයෙනි, මේ රජගහ නුවර සිත් අලවන සුළුය, එසේ ම නිග්‍රෝධය සිත්කලු ය. චෞර ප්‍රපාතය සිත්කලු ය. වේභාර පර්වතය පාර්ශවයෙහි වූ සප්තපර්නී ගුහාව ද සිත්කලු ය. ඉසිගිලි පාර්ශවයේ කාලශිලාව ද සිත්කලු ය. ශිතවනයෙහි වූ සප්පසොණ්ඩික පබ්භභාරය ද මනරම් ය. තපෝදාරාමය ද එබඳුම ය. තව ද කලන්දක නිවාපි නම් වූ වේළුවනයත් මද්දකුච්ඡි නම් වූ මුව වනයත් සිත් ඇදගන්නා සුළු ය. එපර්ද්දෙන් ම ආනන්දය,ජීවකයන්ගේ අඹ උයන ද මනරම් ය.”

# බුදුන් වහන්සේ පරිසරයේ සොඳුරු බව ඇගයිමට ලක් කළ අවස්ථා

- විශාලා මහනුවර පිහිටි සුන්දර ස්ථාන වර්ණනා කිරීම

විශාලා මහනුවර උදේන, ගෝතමක, සත්තම්බක, සාරන්දද ආදී චෛත්‍ය ස්ථාන ගණනාවක රමණීය බව දේශනාකර ඇත.

# බුදුන් වහන්සේ පරිසරයේ සොඳුරු බව ඇගයීමට ලක් කළ අවස්ථා

- ✓ පක්ෂීන් වෙසෙන, මහ හඬක් නගන වනය තමන්ට බිය උපදවන බව කී දෙවියෙකුට තමනට එම පරිසරය සිත් පිනවන සොඳුරු තැනක් බව පැවසීම

එක් අවස්ථාවක බුදුරදුන් හුදකලාව වසයෙහි වෙසෙන විට දෙවියෙක් පැමිණ මද්දහනෙහි විවේක ගන්නා වූ පක්ෂීන් වෙසෙන මහ හඬක් නගන වනය තමනට බිය උපදවන තැනක් බව පවසයි. නමුත් බුදුරජාණන් වහනසේ ඔහුට දන්වා සිටියේ තමනට එම පරිසරය සිත් පිනවන සොඳුරු තැනක් බවය.

# බුද්ධ චරිතය තුළින් පරිසර සුරක්ෂිතතාවට ගත හැකි ආදර්ශ

- තුරු ලතාවන්හි, ජල තලාවන්හි, පිරිසිදු වාතයෙහි ආරක්ෂාව තහවුරු වන ලෙස බුදු රදුන් තම ජීවිතය ගත කිරීම.
- අනවශ්‍ය ලෙස උස් හඬින් කතා කරන, ප්‍රලාපයන්හි යෙදෙන මිනිසුන් සිටින තැන්වලට වැඩම කිරීම ප්‍රතික්ෂේප කිරීම
- ළමුන් පිරිසකගේ හිරිහැරයට ලක්ව සිටි ගැරඬියෙකු ඉන් ගලවා ගැනිම, හද්‍රවතිකා ඇතින්නට පුරුදු උවටැන් ලබාදීමට සැලැස්වීම තුළින් ජීව පරිසරයේ ආරක්ෂාව තහවුරු කිරීම.

# තෙරුවන් සරණයි...!